ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2005

නීති විද්‍යාව – LWU 4311 / 4321

කාලය - පැය තුනයි

---

දිනය: 2006 අප්‍රේල් මස 28 වන දින　　　　වේලාව: ප. ව. 1.30 සිට ප.ව. 4.30 දක්වා

---

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

1. වසර 2500 ක ඉතිහාසයක් ඇති පරිසරයක 'ස්වභාවික නීතිය යනු කුමක් ද' යන ප්‍රශ්නයට විවිධ පිළිතුරු ඉදිරිපත්වීම පුදුමයට කරුණක් නොවේ. 'ස්වභාවික නීතිය' යන වදනට අඛණ්ඩභාවයක් ඇති නමුත් එම සංකල්පය ස්ථිතිකව පැවති බව ඉන් අදහස් නොවේ. එයට විවිධ අරුත් පැවති අතර සම්පූර්ණයෙන් වෙනස් අරමුණු ඉටු කර ඇත. ඩී අන්ත්‍රේව්ස් පෙන්වා දෙන පරිදි "ස්වාභාවික නීතියේ විවිධාර අරුත්වලට හේතුව වී ඇත්තේ එය යටින් දිවෙන ස්වාභව ධර්මය පිළිබඳ සංකල්පයේ අර්ථ ව්‍යාකූලභාවයයි."

   ඉහත ප්‍රකාශ කරන ලද අදහස්වල අනුසාරයෙන් ස්වභාවික නීති සිද්ධාන්තයේ විකාශය පිළිබඳ සටහනක් ලියන්න. විවිධ කාලපරිච්ඡේදයන්හි දි ස්වාභාවික නීති මතවාදයේ යෝජකයන් විසින් යොදා ගනු ලැබූ විවිධ සිද්ධාන්තයන්හි ප්‍රබලතාවන් හා දුර්වලතාවන් ඔබේ පිළිතුරෙහි සාකච්ඡා කළ යුතු වේ.

2. "දේව නීතිය සමග ගැටෙන මානව නීති නොබැඳෙන සුලූ බව එනම් ඒවා නීති නොවන බව පැවසීම සම්පූර්ණයෙන්ම විකාරයකි. බොහෝ අනර්ථකාරි නීති එකී අනර්ථකාරි බව නිසාම දෙවියන්ගේ කැමැත්තට ප්‍රබල ලෙස පටහැනි වුව ද අධිකරණ විනිශ්චය සභා විසින් නීති වශයෙන් ක්‍රියාවේ යොදවා ඇතිවාක් මෙන්ම අඛණ්ඩව ක්‍රියාවේ යොදවමින් ද පවති. උපද්‍රව රහිත හෝ ධනාත්මක ලෙස ප්‍රයෝජනවත් වන්නා වූ ක්‍රියාවක් ස්වාධිපත්‍යයා විසින් තහනම්කොට එය උල්ලංඝනය කළහොත් මරණ දණ්ඩනය පණවන බව ප්‍රකාශ කළේ යැයි සිතන්න. මම එම ක්‍රියාව කළහොත් මට එරෙහිව නඩු පවරා වැරදිකරු බවට පත් කරනු ඇත. එම තීන්දුවට මම එරෙහි වූවහොත් එනම් දුෂ්ට ප්‍රතිඵල ඇති නොකරන්නා වූ ක්‍රියාවන් මානව නීති සම්පාදකයන් විසින් තහනම් නොකළ යුතු යැයි ප්‍රකාශ කළා වූ දෙවියන්ගේ නීතියට එම තීන්දුව ප්‍රතිවිරුද්ධ බව මා විසින් ප්‍රකාශ කරනු ලැබුවහොත් අධිකරණය විසින් මගේ තර්කයේ ඒත්තුනොගැන්වෙනසුලුබව පෙන්වනු ලබන්නේ මා විසින් වලංගුභාවය අභියෝගයට ලක් කරනු ලැබූ නීතියට අනුව මා එල්ලා මරා දමමිනි.

   ඉහත තර්කය තහවුරු කරන්නා වූ නීති විද්‍යාත්මක සිද්ධාන්තය විවේචනාත්මකව ඇගැයීමට ලක් කරන්න. ඔබේ අදහස් තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ නීති ක්‍රමයෙන් නිදසුන් ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ.

3. “ඓතිහාසික ගුරුකුලය නීතික අගුහවාදයක් වන බවට චෝදනා එල්ල වී ඇත. හේතු තර්කවාදීන් අනාගතයට ගෞරව කිරීම මගින් වැරැද්දක් සිදු කලේ නම් ඓතිහාසික නීතිවේදීන් අතීතයට ගෞරව කිරීමෙන් වැරැද්දක් සිදු කළහ. ඔවුන් විසින් ප්‍රතිසංස්කරණවාදී කර්තව්‍යයන්හි දැත් සම්ප්‍රදායන් නැමති විලංගුවලින් බැඳ දැමූ බව කියනු ලැබේ. ව්‍යවස්ථා, විශේෂයෙන්ම සංග්‍රහගත කළ ව්‍යවස්ථා පිළිබඳ ව ඓතිහාසික නීති විශාරදයින් තුළ වූ අවිශ්වාසය මගින් පෙන්නුම් කරනු ලැබුවේ කැමැත්ත පිළිබඳව අධෛර්යමත් කරන්නා වූ සැකසංකාවක් සහ ද්‍රව්‍යමය වටාපිටාව පාලනය කිරීම සඳහා ගන්නා මානව ප්‍රයත්නයේ සඵලභාවය පිළිනොගැනීමකි.

ඉහත ප්‍රකාශය නීති විද්‍යාවේ ඓතිහාසික ගුරු කුලයේ ඉගැන්වීම් කෙරෙහි එල්ල කරන ලද සාධාරණ විවේචනයක් ලෙස ඔබ සලකන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

4. හර්බර්ට් ස්පෙන්සර් සහ ඇඩම් ස්මිත්ට අනුව ආර්ථික සම්පත් බෙදියාම සම්බන්ධයෙන් නීතියේ මැදිහත්වීම මගින් සහ බලය යොදවා ඇති කරනු ලැබූ සමාජ සමානත්වය මගින් මෙන් ම පුද්ගලයාට කාර්යයන් බෙදා දීම මගින් ද මානව ක්‍රියාකාරිත්වය වර්ධනය කළ නොහැකිය. ඔවුනට අනුව එවැනි සියලූ සීමා කිරීම් ඉවත් කිරීම පුද්ගල ක්‍රියාකාරිත්වය වර්ධනය කිරීමේ මාර්ගයයි. අනෙක් අතට, සංවර්ධනය සඳහා ප්‍රධාන සාධකය වන්නේ මානව ක්‍රියාකාරිත්වය බව පිළිගනු ලැබුවත් මානව ක්‍රියාකාරිත්වය සමග නිරතුරුවම මිනිසාගේ කෑදරකම සහ දියුණුවීමේ අභිලාශය එක්ව ගමන් කරන බවත් එමෙන් ම මානව ක්‍රියාකාරිත්වය මිනිස් හැකියාවන් වර්ධනය කිරීම සඳහා ඇන්තා වූ අවස්ථාවන්හි පවත්නා අසමානතාවන්ගෙන් කැළැල් වී ඇති බවත් මතක තබා ගත යුතුය. අයිතිවාසිකම් සහ සමාජ ඉංජිනේරුවිද්‍යාව පිළිබඳ නීති විද්‍යාව තුළින් ඉයරිං සහ පවුන්ඩ් ආමන්ත්‍රණය කිරීමට උත්සාහ කරන ලද ප්‍රාථමික කරුණ මෙයයි. න්‍යායානුකූලව සමාජවිද්‍යා ගුරුකුලය විසින් නීතියට අවම කාර්යභාරයක් පැවරනු ලැබුවද ආරක්ෂාකාරී හා සමබර පරිසරයක් ඇති කිරීමේ ක්‍රියාවලියේ දී නීතියේ කාර්ය භාරය අවම තත්ත්වයට වඩා වැඩි දෙයක් වන බවට තර්ක කළ හැකිය. ප්‍රධාන කරුණ වන්නේ ඉහත ක්‍රියාවලියේ දී අයුතු වාසි සහ අසාධාරණ භාවිතාවන් වැළැක්වීම හා පාලනය කිරීමයි.

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක භාවිතාවන් කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරමින් විවේචනය කරන්න.

5. ඇමරිකානු යථාර්තවාදී ව්‍යාපාරයේ ප්‍රධාන නැඹුරුතාවන් වන්නේ නෛතික නිශ්චිතභාවය ප්‍රශ්න කිරීමත් සංකල්පගතකිරීම යනුවෙන් හඳුන්වන දෙයට පහර දීමත්ය. එමෙන්ම නඩු කටයුතුවල දී ඇති වන්නා වූ අනපේක්ෂිත තත්ත්වයන්ට හේතු පාදක වන්නා වූ නඩු විසඳීමේ ක්‍රම වේදයේ සහ විශේෂයෙන්ම අධිකරණ ශිල්ප ක්‍රමවල ඇති බොහෝ බලපෑම් පිළිබඳව අවධාරණය කිරීම ද ඇමරිකානු යථාරථවාදයේ ප්‍රධාන ලක්ෂණයකි.

ඇමරිකානු යතාර්ථවාදී ව්‍යාපාරයේ දාර්ශනික පදනම සංක්ෂේපයෙන් දක්වමින් ශ්‍රී ලංකා නීති ක්‍රමයේ යථා ස්වභාවය අවබෝධ කර ගැනීම සඳහා එම ව්‍යාපාරය කොපමණ දුරට උපකාරී වන්නේ දැයි පැහැදිලි කරන්න.

6. ස්කැන්ඩිනේවියානු යථාර්ථවාදය විසින් සියලු නෛතික සංසිද්ධීන් 'අධ්‍යාත්මක විද්‍යාවන්ගෙන්' වෙන් කරලීම සඳහා කරනු ලබන දැඩි අවධාරණය හේතුකොටගෙන සමහර නීතිවේදීන් ස්කැන්ඩිනේවියානු යතාර්ථවාදය විස්තර කරනු ලබන්නේ 'අධ්‍යාත්මික විද්‍යාවන් කෙරෙහි විශ්වාසය නොතබන්නක් ලෙසය. සමහර ස්කැන්ඩිනේවියානු යථාර්ථවාදීන්ට අනුව අධ්‍යාත්මික විද්‍යාවන් යන්න බොහෝ දුරට ප්‍රාථමික විජ්ජාවන්ගෙන් පැවත එන්නකි.

සාකච්ජා කරන්න.

7. (අ) ජන සමාජයක නීති ක්‍රමය කෙල්සන් විසින් නිරූපණය කරන ලද්දේ කෙසේ ද? (ලකුණු 5 යි)

(ආ) මූලනියාමය (grundnorm) යන වදනෙන් කෙල්සන් අදහස් කළේ කුමක් දැයි පැහැදිලිකොට මූලනියාමයක වලංගු භාවය තීරණය කරන්නේ කෙසේ දැයි විස්තර කරන්න. (ලකුණු 7 යි)

(ඇ) විප්ලවයකින් පසු නෛතික සහ දේශපාලනික තත්ත්වයන් අතර උද්ගත වන ගැටුම් නිරාකරණය කිරීමේ දී කෙල්සන්ගේ නෛතික වලංගු භාවය පිළිබඳ මූලධර්ම හොඳම මග පෙන්වීම වශයෙන් සලකන්නේ කුමක් නිසා ද? (ලකුණු 13 යි)

8. මාර්ක්ස්වාදී න්‍යායට අනුව ඊනියා 'සදාකාලික ප්‍රභේදයන්' 'යුක්තිය පිළිබඳ මූලික අදහස්'' සහ 'අයිතිවාසිකම් පිළිබඳ වෙනස් නොවන සංකල්ප' යන්නට නෛතික මතවාදයෙහි ඇත්තේ ඉතා අඩු සම්බන්ධතාවකි. නෛතික මතවාදය යන්න පන්ති ආධිපත්‍යය සහ මර්ධනය මගින් නිරූපණය කරන්නා වූ සමාජයක පවතින එදිරිවාදිකම් පිළිබිඹු කරන සහ එක්තරා ආකාරයක ආර්ථික නිෂ්පාදන ක්‍රියාවලියක පදනම මත නිර්මාණය වූ සමාජ උපරි ව්‍යුහයක හඳුනාගත හැකි කොටසකි .

මෙම මාක්ස්වාදී ස්ථාවරය ශ්‍රී ලංකා නීතියේ ස්වභාවය පිළිබඳ නියම චිත්‍රයක් පිළිබිඹු කරන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

හිමිකම් ඇවිරිණි

************